කැලණිය අධ්‍යාපන කලාපය
මධ්‍යවාර පරීක්ෂණය - 2015
ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය.
06 ශ්‍රේණිය

නම :-

කාලය පැය 02

1 පත්‍රය

➢ සියලුම ප්‍රශ්නවලට ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.

අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

1) අතීත ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය කේන්ද්‍රගතව තිබුණේ
   1. රජයේ පාසල් ආශ්‍රිතවය
   2. පන්සල් හා පිරිවෙන් ආශ්‍රිතවය
   3. ජාත්‍යන්තර පාසල් ආශ්‍රිතවය
   4. ජාතික පාසල් ආශ්‍රිතවය

2) පාසල් සමාජිකයින් තමන්ගේ යුතුකම් හා වගකීම් ඉටුකිරීමෙන් පාසලේ,
   1. ගුණාත්මකභාවය වර්ධනය වේ
   2. ප්‍රමාණාත්මකභාවය වර්ධනය වේ
   3. ශිෂ්‍ය සංඛ්‍යාව වර්ධනය වේ
   4. භෞතික සම්පත් වර්ධනය වේ

3) පාසල් ශිෂ්‍යයකු සතු යහපත් ගති ලක්ෂණයක් නොවන්නේ
   1. අන් අයට ගරු කිරීම
   2. සතුටින් සිටීම
   3. කළහකාරී වීම
   4. විනයගරුක වීම

4) ශ්‍රී ලංකාවේ පරිපාලන බෙදීම් අනුව කුඩාම පිරිපාලන ඒකකය වන්නේ
   1. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
   2. දිස්ත්‍රික්කය.
   3. පළාත
   4. ග්‍රාම නිළධාරී කොට්ඨාසය

5) ශ්‍රී ලංකාවේ අතිශය නාගරික සංකීර්ණ පරිසරයක් සහිත බල ප්‍රදේශය
   1. නගර සභාය
   2. මහනගර සභාය
   3. ප්‍රාදේශීය සභාය
   4. ගම් සභාය

අංක 6 සිට 10 දක්වා ප්‍රකාශ නිවැරදි නම් හරි (✓) ලකුණද වැරදි නම් වැරදි (×) ලකුණද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

6) තම හැකියාව ක්ෂේත්‍ර ලියැවුණු පොතපත පරිශීලනය තුළින් ඔබ හැකියා හා දක්ෂතා වර්ධනය කළ හැකිය ( )
7) ඔබ තුළ ඇති දුර්වලතා අන් අය පෙන්වා දීමට පෙර ඔබම ඒවා හඳුනා ගත යුතු වේ ( )
8) පංතිකාමරය හා පාසලේ පවිත්‍රතා කටයුතු සැලසුම් කිරීමට සහාය දැක්විය යුතු නොවේ ( )
9) සොබා දහමින් ලබා දී ඇති සම්පත්, ඒවාට හානියක් නොවන සේ පරිහරණය කිරීම මිනිසා සතු යුතුකමකි ( )
10) අපිට සේවා සපයන ආයතන වලින් අයථා අයුරින් සේවය ලබා ගැනීම අපේ යුතුකමක් වේ ( )

අංක 11 සට 15 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර පහත වරහන තුළ දී ඇති පිළිතුරුවලින් තෝරා තිත් ඉර මත ලියන්න.

(අභිමානය/ මානව ශිෂ්ටාචාරය/යහපත් ජීවිතයක්/සුහදතාවය/ ජීව දත්ත/කීර්ති නාමය)

11) ඔබගේ පෞද්ගලික තොරතුරු ඇතුළත් කර ඇති පත්‍රිකාව ................................... පත්‍රිකාව ලෙස හඳුන්වයි
12) තම යුතුකම් හා වගකීම් ඉටු කිරීම තුළින් පාසලේ ....................................... හා ගෞරවය රැක ගැනීමට දායක විය හැක.
13) මාතෘභූමිය සතු වූ සම්පත් මෙන්ම පොදු දේපල සුරකිමින් උපන් දේශයේ ................................ රැක ගැනීමට කැපවීම යහපත් පුරවැසියෙකුගේ වගකීම වේ
14) සාමූහික ජීවිතයක් ගත කිරීම නිසා ම මිනිස් සමාජය ගොඩ නැගුණු අතර ඔවුන්ගේ සාමූහික පැවැත්ම ............................................................... ගොඩනැගීමට හේතු වේ
15) දරුවන්ට අධ්‍යාපනය ලබා දී ..................................... ගත කිරීමට මග පෙන්වීම පාසලෙන් සමාජයට සැපයෙන සේවාවක් වේ

අංක 16 සිට 20 දක්වා ඇති ප්‍රශ්නවලට 'අ' හා 'ඉ' තීරුවල ඇති ප්‍රකාශ ගලපා යා කරන්න

| අ | ඉ |
|---|---|
| 16) ළමයින් සතුව පවතින දුර්වලතාවයකි | A) නියමිත නිල ඇඳුමින් සැරසී පාසලට පැමිණීම |
| 17) සැලසුමකට අනුව වැඩ නොකිරීම නිසා | B) යහපත් සිරිත් විරිත් පිළිපැදීම |
| 18) ළමුන් සම්බන්ධයෙන් පාසලක පවතින පොදු නීතියකි | C) පසු තැවීමට සිදුවේ |
| 19) ඔබේ පාසල ඔබ වෙනුවෙන් ඉටුකරන මෙහෙය ප්‍රකාශ වෙයි | D) අන් අයට උදව් කිරීමට අකමැති වීම |
| 20) පාසල මඟින් අවට ප්‍රජාවට දෙන පණිවිඩය | E) මෙහෙවර ප්‍රකාශය |

කැලණිය අධ්‍යාපන කලාපය
මධ්‍යවාර පරීක්ෂණය - 2015
ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය.
06 ශ්‍රේණිය

නම :-

පත්‍රය - 11

<u>**පළමු ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න**</u> හතරකට' <u>**පිළිතුරු සපයන්න**</u>

1. පුරවැසි අධ්‍යාපනය විෂයභාර ගුරු මහත්මිය/මහතා විසින් ඔබ තුළ පවතින දක්ෂතා හඳුනාගත හැකි ක්‍රම පිළිබඳ දැනුවත් කර දී පහත ප්‍රශ්නාවලිය ඔබ වෙත සපයන ලදී. ඒ අනුව ප්‍රශ්නාවලියට අදාළ තොරතුරු සපයන්න.

   i. ඔබ පෙන්වා ඇති දක්ෂතා මොනවා ද?
   ii. ඔබට ජයග්‍රහණය හිමි වී ඇති අවස්ථා මොනවා ද?
   iii. ඔබ කර ඇති නිර්මාණ මොනවා ද?
   iv. අන් අයගේ දක්ෂතා ඔබ හඳුනාගෙන තිබේ ද?
   v. එම දක්ෂතා අගය කිරීමට අනුගමනය කළ ක්‍රියා මාර්ග මොනවා ද?
   vi. අන් අය ඔබ සතු යැයි සිතන ඔබේ හැකියා මොනවා ද?
   vii. අන් අය ඔබට ප්‍රශංසා කරන්නේ ඔබගේ කුමන දක්ෂතා වලට ද?
   viii. අන් අයගේ ඔබ ප්‍රශංසා ලබන විට ඔබට දැනුණු හැඟීම් මොනවා ද?

2 i. තමන් සතු දුර්වලතා දෙකක් නම් කරන්න. (ලකුණු 02)

   ii. එම දුර්වලතා අවම කර ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග තුනක් සඳහන් කරන්න (ලකුණු 03)

   iii. කුඩා කළ මතු වූ හෝ හඳුනාගත් දක්ෂතා තම ඉදිරි ගමනට යොදාගෙන ජීවිතය ජයගත් එමෙන්ම මෙරටේ අධ්‍යාපනයට අමිල මෙහෙයක් කළ ආචාර්ය සී.ඩබ්.ඩබ්. කන්නංගර මැතිතුමා පිළිබඳව බිත්ති පුවත්පතකට ලිපියක් සකස් කරන්න. (ලකුණු 06)

3. i. 6 ශ්‍රේණියේ සිසුවියක ලෙස ඔබේ ජීවිතයේ සාර්ථකත්වය උදෙසා ඇති කරගත යුතු අරමුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

   ii. සැලසුමකට අනුව වැඩ කිරීම නිසා අත්කර ගතහැකි වාසි තුනක් සඳහන් කරන්න (ලකුණු 03)

   iii. පංති කාමරය පවිත්‍රව හා පිළිවෙලකට තබා ගැනීම සඳහා ක්‍රියාත්මක කළ හැකි වැඩසටහනක් සකස් කරන්න (ලකුණු 06)

4. i. පාසල් සංස්කෘතියට අයත් දේවල් දෙකක් සඳහන් කරන්න (ලකුණු 02)

   ii. ළමයින් සම්බන්ධයෙන් ඔබේ පාසල පවත්වාගෙන යන පොදු නීතිරීති තුනක් ලියන්න (ලකුණු 03)

   iii. ඔබේ පාසලේ පවත්වාගෙන යන සම්ප්‍රදායන් දෙකක් සඳහන් කර එම සම්ප්‍රදායන් රැක ගැනීමේ ඇති වැදගත්කම ගැන කෙටියෙන් විස්තරයක් කරන්න (ලකුණු 06)

5. i. ඔබේ පාසලේ 'දැක්ම' සටහන් කරන්න (ලකුණු 02)

ii. ඔබේ පාසලේ අනන්‍යතාවය පිළිඹිබු කරන සංකේත හයක් ලියන්න (ලකුණු 03)

iii. පාසල් සාමාජිකයකු ලෙස ඔබ සතු අයිතිවාසිකම් දෙකක් සඳහන් කර ඔබේ හැකියා වර්ධනය කර ගැනීම සඳහා පාසල විසින් සපයා ඇති පහසුකම් මොනවා දැයි පෙන්වන ලැයිස්තුවක් පහත සඳහන් පරිදි සකස් කරන්න. (ලකුණු 06)

| | ඔබ සතු හැකියාවන් | පාසලෙන් සපයා ඇති පහසුකම් |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |
| 5 | | |

6. i. ඔබ ප්‍රදේශයේ හඳුනාගත හැකි මානව සම්පත් හතරක් පෙන්වා දෙන්න (ලකුණු 02)

ii. ඔබ ප්‍රදේශයේ වෘත්තිය පුහුණු ආයතන මගින් පවත්වාගෙන යනු ලබන වෘත්තීය පුහුණු පාඨමාලා තුනක් නම් කරන්න (ලකුණු 03)

iii. මානව සම්පත් විධිමත් පුහුණු කිරීමෙන් ලබාගත හැකි ප්‍රයෝජන දෙකක් විස්තර කරන්න (ලකුණු 06)

7. i. ඔබ ප්‍රදේශයේ ජනතාව එකතු වී පිහිටුවාගෙන ඇති සමිති සමාගම් දෙකක් සඳහන් කරන්න (ලකුණු 02)

ii. එම සමිති සමාගම් මගින් ඉටුවන සේවාවන් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

iii. ආගමික සිද්ධස්ථාන මගින් ඉටුකරන සේවා දෙකක් සඳහන් කර ඒ පිළිබඳ වෙන වෙනම පැහැදිලි කරන්න (ලකුණු 06)